# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 28 දරන ශ්‍රී ලංකා විත්මයා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 මැයි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 28 දරන ශ්‍රී ලංකා චින්මයා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 70/80.

**ශ්‍රී ලංකා චින්මයා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පසුගිය අවුරුදු කීපය තිස්සේ, අති පූජනීය චින්මයානන්ද ස්වාමිවරයා විසින් හින්දු ධර්ම ග්‍රන්ථ සහ දර්ශනවාදය අධ්‍යයනය කිරීමට දිරිගන්වනු ලැබ ඇති හෙයින් සහ උපරිම ආත්මාවබෝධය ලබා ගැනීම පිණිස ලොව පුරා විසිරී සිටින ජනතාවට මඟ පෙන්වනු ලැබ තිබෙන හෙයින් ද : පූර්විකාව.

තවද, එතුමාණන්ගේ අනුශාසනාවලින් සහ මඟ පෙන්වීම්වලින් දිරිගැන්වුණු සහ ප්‍රබෝධමත් වුණු ශ්‍රී ලංකාවේ අනුගාමිකයන් විසින්, එකී අනුගාමිකයන්ගේ සාමාජිකත්වයෙන් සැදුම් ලත් ශ්‍රී ලංකා චින්මයා සංගමය යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වී තිබෙන ජීවිවලට අනුකූලව, එකී අති පූජනීය චින්මයානන්ද ස්වාමිවරයාගේ ධර්ම පණිවුඩය ශ්‍රී ලංකාවේ මෙන් ම ඉන් බැහැර රටවල්වල ද සාර්ථක ලෙස පතුරුවාලීමේ සහ සංගමයට සම්බන්ධ විවිධ කරුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පිහිටුවනු ලැබූ හෙයින් ද :

තවද, එකී සංගමය සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 28 දරන ශ්‍රී ලංකා චින්මයා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා චින්මයා සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස ඇතුළත් කරගනු ලබන තැනැත්තන් "ශ්‍රී ලංකා චින්මයා සංගමය" යන නාමය සහ අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර පොදු මුද්‍රාවක් තබාගෙන, එය පාවිච්චි කිරීමේ ද, තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඇතිව, සංස්ථාව විසින් එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය. ශ්‍රී ලංකා චින්මයා සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) සනාතන ධර්මානුශාසනාවලට අනුකූලව සියලු ජනතා කොටස් අතර විශ්ව සහෝදරත්වය ඇති කරලීම ;

(ආ) ජාතික, ආගමික සහ වාර්ගික සමගිය ඇති කිරීමේ ලා සහ සමාජයීය අශක්‍යතා මුලිනුපුටා දැමීමේලා සහායවීම ;

(ඇ) ලෝක ජනතාව අතර සාමය සහ සමගිකම් වඩාලීමේ ලා දේශීය සහ විදේශීය සංවිධාන සමඟ සහයෝගීව කටයුතු කිරීම ;

(ඈ) සෙසු ආගම් තුලනාත්මක ලෙස අධ්‍යයනය කිරීම සඳහා සහ සියලු හින්දු දර්ශනවාද ක්‍රම අධ්‍යයනය කිරීම සඳහා කටයුතු සැලැස්වීම සහ ඊට දිරි ගැන්වීම සහ මේ කාර්යය සඳහා, හින්දු දර්ශනවාදය අධ්‍යයනය කිරීමට ජාත්‍යන්තර හින්දු මධ්‍යස්ථානයක් පිහිටුවීම ;

(ඉ) සංස්ථාවේ අරමුණු සහ පරමාර්ථ ඉදිරියට ගෙන යාම සඳහා, වේද ආගම් පාසැල්, ගුරුකුල, ආශ්‍රම සහ වෙනත් එවැනි ආයතන සැපයීම, පිහිටුවීම, ප්‍රදානය කිරීම, නඩත්තු කිරීම, පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ ශ්‍රී ලංකාවේ හා පිටරට සිටින සුදුසු ශිෂ්‍යයන්ට ණය, ශිෂ්‍යත්ව හා තෑගි ප්‍රදානය කිරීම සහ වෙනත් පහසුකම් සැපයීම ;

(ඊ) මනුෂ්‍යවර්ගයා කෙරෙහි කැපවීමෙන් යුතුව කටයුතු කිරීම සඳහා සහ මනුෂ්‍යවර්ගයාට සේවය කිරීම සඳහාත්, අධ්‍යාත්මික ගුණවගාව සහ වේදන්ත දර්ශනවාදය පිළිබඳ ඥානය අත් කර ගැනීම සඳහාත් ශිෂ්‍යයන්ගේ සහ වෙනත් අයගේ ජීවිත හුරු කිරීම ;

(උ) ගායනා යාඥා, අධ්‍යයන කණ්ඩායම්, දෙවි කණ්ඩායම්, බල් විහාර්, බල් මන්දිර්, බජන් කණ්ඩායම්, ශාස්ත්‍රීය කර්ණාටක සංගීත පන්ති, යෞවන සමිති හෝ කණ්ඩායම් සංවිධානය කිරීම සහ ඊට අදාළ හෝ ආනුෂංගික වෙනත් යම් ක්‍රියා කිරීම ;

(ඌ) අනාථාගාර, සායනික, රෝහල්, රෝග නිර්ණය කිරීමේ මධ්‍යස්ථාන හා ප්‍රජා ශාලා ඉදි කිරීම, පවත්වා ගෙන යාම සහ පරිපාලනය කිරීම සහ කවර ආකාරයකින් හෝ සුදුසු තැනැත්තන්ට වෛද්‍ය සහන සහ ආධාර සැලසීම ;

(එ) සංස්ථාවේ පරමාර්ථ සිය කැමැත්තෙන් පතල කරන පූජක යන්ට සහ වෙනත් තැනැත්තන්ට මුදලින් හෝ ද්‍රව්‍ය යෙන් ආධාර දීම ;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, සම්මේලන, කාර්ය සැසි, පන්ති, විවාද, සාකච්ඡා, සංචාර, ආගමික වන්දනා ගමන්, විනෝද ගමන් හෝ වෙනත් යම් කටයුතු දිරි ගැන්වීම, සංවිධාන කිරීම සහ පැවැත්වීම ;

(ඔ) පොත්, සඟරා, වාර සඟරා, කලාප මිළදී ගැනීම සහ නිකුත් කිරීම සඳහා සහ සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය ලෙස සලකනු ලබන වෙනත් සේවා සැලසීම සඳහා පුස්තකාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ඕ) ශිෂ්‍යත්ව, තෑගි සහ දීමනා පිරිනැමීම සඳහා කටයුතු සැලැස් වීම සහ අධ්‍යාත්මික, දාර්ශනික හෝ සංස්කෘතික අධ්‍යයන කටයුතු සඳහා දිරි දීම ;

(ක) සංස්ථාවේ පරමාර්ථවලට සම්පූර්ණයෙන්ම සමාන වන පරමාර්ථ ඇති හෝ සංස්ථාවේ පරමාර්ථවලින් කොටසකට සමාන වන පරමාර්ථ ඇති වෙනත් සංගම්, සමිති හෝ සංවිධාන සමග සහයෝගයෙන් හෝ සම්බන්ධ වී හෝ කටයුතු කිරීම;

(ග) ශ්‍රී ලංකාවේ හෝ විදේශවල ආගමික, දර්ශනවාදී හෝ සාම සාකච්ඡාවලට නියෝජිතයන් යැවීම;

(ච) වෙනත් රටවල්වල චින්මයා සංගම් සමග නිතර සම්බන්ධව සිටීම සහ සංස්ථාවේ පරමාර්ථ සහ කාර්ය ඉටු කර ගැනීම පිණිස ඒ සංගම් සමග අදහස් හුවමාරු කර ගැනීම සහ සහයෝගීව කටයුතු කිරීම;

(ජ) සංස්ථාවේ පරමාර්ථ හුවා දක්වමින් කලාප, වාර සඟරා, පුවත්පත් සහ සඟරා මුද්‍රණය කිරීම, පළ කිරීම, විකිණීම සහ බෙදා හැරීම සහ මේ කාර්ය සඳහා, මුද්‍රණාල අයිතිව තබා ගැනීම හෝ බද්දට ගැනීම සහ ඒ කටයුතු කිරීම සඳහා අවශ්‍ය සේවකයන් පත් කිරීම; සහ

(ට) සාමාන්‍යයෙන් සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය, යෝග්‍ය හෝ ආනුෂංගික වෙනත් දේ කිරීම.

4. (1) සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු, ඒ රීති අනුව නම් කරනු ලබන, තෝරා පත් කර ගනු ලබන හෝ පත්කරනු ලබන නැනැත්තන් සංඛ්‍යාවකගෙන් සමන්විත විධායක කමිටුවක් විසින් පරිපාලනය කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන වේලාවේ දී ධුර දරන සංගමයේ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය.

5. (1) සංස්ථාවේ සාමාජිකයන් බඳවා ගැනීම සහ ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම සඳහා ද, සංස්ථාවේ විධායක කමිටුවේ නිලධරයන්ගේ සහ වෙනත් සාමාජිකයන්ගේ කාර්ය ඉටු කිරීම සඳහා ද, සංස්ථාවේ රැස්වීම් කටයුතු පිළිබඳ කාර්ය පටිපාටිය සඳහා ද, සාමාන්‍ය වශයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද සංස්ථාව විසින්, කලින් කල, සාමාන්‍ය සභා රැස්වීමක දී, ඒ රැස්වීමට පැමිණ, ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකක ඡන්දයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

රීති.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින බලපැවැත් වූ, සංගමයේ රීති, මේ වගන්තිය යටතේ සාදන ලද, සංස්ථාවේ රීති ලෙස සැලකිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ රීති සාදනු ලැබිය හැකි ආකාරයෙන් ම, සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා යම් රීතිය කට හෝ මින් මතු සම්මත කරනු ලබන යම් රීතියකට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමයෙන් ගෙවිය යුතු හා සංගමයට අයවිය යුතු ණය.

6. මේ පනත ක්‍රියාත්මක වන වේලාවේ දී පවත්නා සංගමයේ සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සංගමයට අයවිය යුතු සියලුම ණය, දායක මුදල් සහ සහභාග මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

7. විධිමත් ලෙස බලය පවරන ලද, විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

සංස්ථාව විසින් නිශ්චල හා චංචල දේපළ තබා ගත හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් බූදල් බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමටත්, තබා ගැනීමටත් නීතියෙහි ලා සංස්ථාවට හැකියාව ඇත්තේ ය. තව ද එකී සියලු දේපළ ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හා අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් තබා ගත යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරි දේපළ.

9. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලුම ණය සහ බැරකම් ගෙවා සමථයකට පත් කරනු ලැබීමෙන් පසු, කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සහ යම් ආදායමක් හෝ දේපළක් තම සාමාජිකයන් අතර බෙදා දීම තම රීති මගින් තහනම් කරනු ලැබ තිබෙන වෙනත් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් සංස්ථාව විසුරුවා හරින වේලාවේ දී හෝ ඊට පෙරාතුවම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කළ යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.